# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல | 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/PTR/20-3/FI/3-2027 ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } දිනය / திகதி / Date } 2026.09. 14

බස්නාහිර පළාතේ
ආණ්ඩුකාර ලේකම්,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සභා ලේකම්,
ලේකම් පළාත් සෞඛ්‍ය/ පාලන/ ප්‍රවාහන/ අධ්‍යාපන/ කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ මුල්‍ය/ සැලසුම්/ ඉංජිනේරු),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

<u>**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027**</u>

උක්ත කරුණ සම්බන්ධව මගේ සමාංක හා 2026.06.24 දිනැති වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය හා බැදේ.

02. බස්නාහිර පළාත් ස්ථාන මාරු කාර්ය පටිපාටික රීති හි 4.1.2 ඡේදය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අනුව පහතින් සඳහන් පරිදි සංශෝධනය කරන ලද බව කාරුණිකව දන්වමි.

- **වර්තමාන සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. (පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වීමට අයදුම් කිරීමේදී අදාල නොවේ)**

03. ඒ අනුව 2027 වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී වර්තමාන සේවා ස්ථානයේ වසර 02ක කාලයක් සම්පූර්ණ නොවීම මත පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් ඉදිරිපත් නොකර, ඒ සඳහා කැමැත්ත පල කරන කළමනාකරණ සේවා නිලධාරීන් සිටීනම්, ඔවුන්ගේ අයදුම්පත් නියමිත ධුරාවලිය ඔස්සේ 2026.09.25 දිනට ප්‍රථම මා වෙත යොමු කිරීමට අවස්ථාව සලසා ඇති බව මෙයින් වැඩිදුරටත් දන්වමි. නියමිත දිනට පසුව ඉදිරිපත් කරන කිසිදු අයදුම්පතක් ස්ථාන මාරු මණ්ඩලයට ඉදිරිපත් නොකරන බව ද තවදුරටත් දන්වා සිටිමි.

කේ.ජී.ප්‍රදීප් පුෂ්ප කුමාර
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත.


දු.ක. - 011-2092599
ෆැක්ස් - 011-2092601
ඊ මේල් - chiefsecwp@gmail.com